# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2018 ජනවාරි මස 05 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2018.01.08 දින නිකුත් කරන ලදී)**


# සිවිල් ගුවන් සේවා (සංශෝධන)

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 18 වන වගන්තියට ඉක්බිතිව ම 18අ අලුත් වගන්තියක් හඳුන්වාදෙනු ලබන අතර, එම සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ, ගගන යාත්‍රාංගනය තුළ තැරැවි කිරීම වරදක් ලෙස දැක්වීම සහ එම වරද සිදු කළ අවස්ථාවක දී අදාළ වන කාර්ය පටිපාටිය නියම කිරීම වේ.

# සිවිල් ගුවන් සේවා (සංශෝධන)

එල්.ඩී.— ඕ. 7/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක          දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතට අලුතින් 18අ වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්තිය එම ප්‍රඥප්තියේ 18අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"ගගන යාත්‍රාංගනයක් තුළ තැරැව් කිරීමේ වරද.

18අ. (1) ගගන යාත්‍රාංගනය තුළ රැඳී සිටීම සඳහා යථා පරිදි බලය පැවරීමක් නොමැතිව එකී පරිශ්‍රය ඇතුළත රැඳී සිටිමින් පැමිණෙන හෝ පිටව යන යම් ගුවන් මගියකුට තැරැව් කිරීමෙහි නියුතුව සිටින බවට 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සේවා සැපයුම්කරුවකුගේ ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන සේවා නියුක්තයකු විසින් හෝ රාජකාරියෙහි යෙදී සිටින පොලිස් නිලධරයකු විසින් සොයාගනු ලබන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තාව, පොලිස් නිලධරයා විසින් සිරභාරයට ගැනීම හෝ සේවා සැපයුම්කරුගේ ගුවන් සේවා ආරක්ෂක සේවා සපයන සේවා නියුක්තයකු විසින් අල්ලා පොලිස් නිලධරයකුට බාරදීම හෝ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පැමිණෙන හෝ පිටව යන යම් ගුවන් මගියකුට, එම ගුවන් මගියාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් හෝ මිතුරකු විසින් නැතහොත් තත්කාර්ය සඳහා සේවා සැපයුම්කරුවකු විසින් බලය

පවරා ඇති ආගන්තුක සත්කාර ව්‍යාපාරයේ ආගන්තුක සත්කාර සේවා සහායකයකු හෝ නියෝජිතයකු හෝ අනුයෝජිතයකු විසින් ප්‍රවාහන පහසුකම් සැපයීම, නැවතීමේ පහසුකම් සැපයීම හෝ ගමන් මලු හෝ භාණ්ඩ යම් වාහනයකට පැටවීම හෝ ඉන් බෑම වැනි යම් සේවා සැපයීමක් මගින් වරදක් සංයුක්ත නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සිරභාරයට ගනු ලැබූ හෝ අල්ලා පොලිස් නිලධරයකුට බාරදෙනු ලැබූ සෑම තැනැත්තකු ම, එම පොලිස් නිලධරයා විසින්, හැකි ඉක්මණින්, වරද සිදුකරනු ලැබුවේ යයි සැලකෙන ප්‍රදේශය සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) 107 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කරනු ලැබිය හැකි අතර, එම තැනැත්තා වරදකරු කිරීමේ දී රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා-

"ආගන්තුක සත්කාර ව්‍යාපාරය" යන්නෙන්, සංචාරක කර්මාන්තයට අදාළ හෝ ආනුෂංගික යම් ව්‍යාපාර කටයුත්තක් හෝ සේවාවක් අදහස් වේ;

"තැරැව් කිරීම" යන්නෙන්, පැමිණෙන හෝ පිටව යන ගුවන් මගියකුට ප්‍රවාහන පහසුකම් හෝ නැවතීමේ පහසුකම් සැපයීම හෝ එම ගුවන් මගියාගේ ගමන් මලු හෝ වෙනත් භාණ්ඩ වාහනයකට

”



පැටවීම හෝ ඉන් බෑම හෝ ඊට සමාන යම් සේවාවක් ලබාදීම සඳහා තත්කාර්ය සඳහා යථා පරිදි බලය පැවරීමක් නොමැතිව, යම් ප්‍රතිෂ්ඨාවක් මත හෝ අන්‍යාකාරයකට, සිදු කිරීමට විමසීම් කිරීම අදහස් වේ.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.